# ලංසු සඳහා ආරාධනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

වාරිමාර්ග අමාත්‍යාංශය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## ඇඹිලිපිටිය, ඇල්ලේ වැව ජලාශ ව්‍යාපෘතියේ වැව් බැම්ම ඉදිකිරීම සඳහා පස් සැපයීම ප්‍රසම්පාදනය

## ජාතික තරඟකාරී ලංසුකරණය

**01.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙනුවෙන් පහත සඳහන් සැපයීම් සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

**වගුව :01**

| ලංසු අංකය | විෂය විස්තරය | ප්‍රමාණය (කියුබ්) | ලංසු ඇපකරය (රු.) |
|---|---|---|---|
| IFB/ID/GOSL/NCB/2024/003 | ඇල්ලේ වැව ජලාශ ව්‍යාපෘතියේ වැව් බැම්ම ඉදිකිරීම සඳහා පස් සැපයීම [කැනීම, පැටවීම, ප්‍රවාහනය කිරීම හා බෑම (Unloading) ඇතුළුව] | 25,000 | 750,000.00 |

**02.** ඉහත සඳහන් මිලදී ගැනීම් සඳහා ලංසු ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලංසු ලිපිලේඛන අදාල ආයතනයේ ලිපි ශීර්ෂයක් මගින් අයදුම් කර රු. **12,500.00** ක ආපසු නොගෙවන ගාස්තුව ගෙවීමෙන් පසු ***2024/02/14*** දින සිට ***2024/03/ 06*** දින දක්වා රජයේ වැඩ කරන දින වලදී **පෙ.ව. 9.00** සිට **ප.ව. 2.00** දක්වා **කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 230 දරන ස්ථානයේ පිහිටි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දෙවන මහලේ කාමර අංක 214** ලිපිනයේ **වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන)** වෙතින් මිලදී ගත හැක.

**03.** මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලේඛන මිලදී ගැනීමට පෙර නොමිලේ පරීක්ෂා කර බැලිය හැකි අතර, වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන) වෙතින් (දුරකථන අංකය: 011-2582897 හෝ 011-2582677) වැඩිදුර තොරතුරු ලබාගත හැක.

**04.** ක්ෂේත්‍ර පරීක්ෂාව සහ පෙර ලංසු කැඳවීම පහත වගු අංක 2 හි පරිදි පැවත්වේ. අදාල නිලධාරීන්ගේ සහය සහිතව ක්ෂේත්‍රය පරීක්ෂාවක යෙදෙන ලෙසට ඉල්ලා සිටිනු ලැබේ.

**වගුව :02**

| ක්ෂේත්‍ර පරීක්ෂාව | පෙර ලංසු කැඳවීමේ රැස්වීම |
|---|---|
| දිනය - 2024 පෙබරවාරි 21<br>වේලාව - පෙ.ව. 10.00<br>ස්ථානය - ප්‍රධාන නේවාසික ඉංජිනේරු කාර්යාලය, ඇල්ලේ වැව ජලාශ ව්‍යාපෘතිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පල්ලේගම, ඇඹිලිපිටිය.<br>047-2262310 | දිනය - 2024 පෙබරවාරි 22<br>වේලාව - පෙ.ව. 10.30<br>ස්ථානය - කමිටු කාමරය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, **අංක 230, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.** |

**05.** ඉහත සැපයුම සඳහා ලබාගත යුතු වන සියලුම අනුමැතීන්, බලපත්‍ර ලබාගැනීම සැපයුම්කරු විසින් සිදුකල යුතු අතර මෙම සැපයුමට අදාල සියලු බදු මුදල් හා අනෙකුත් ගාස්තු ඔහු විසින් දැරිය යුතුය.

**06.** ඉදිරිපත් කරනු ලබන ලංසු **2024/06/06** (ලංසුව විවෘත කරන දින සිට දින 91) දින දක්වා වලංගු විය යුතුය. තවද ඒ සමග වගුව-01 හි සඳහන් වටිනාකම සහිත **2024/07/04** (ලංසුව විවෘත කරන දින සිට දින 119) දින දක්වා වලංගු ලංසු සුරක්ෂණයක් (Bid Security) ඉදිරිපත් කළ යුතුය. වලංගු ලංසු සුරක්ෂණයක් නොමැති ඕනෑම ලංසුවක් ප්‍රතිචාර නොදක්වන ලංසුවක් ලෙස සලකනු ලබන අතර කිසිදු විමසුමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07.** ලංසු ලේඛනයේ සියලුම පිටු ලංසුකරු විසින් අත්සන් කර ඔහුගේ මුද්‍රාව ඇලවිය යුතුය.

**08.** සම්පූර්ණ කරන ලද ලංසු කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ, අංක 230, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ, 03 වන මහලේ කාමර අංක 311 (ප්‍රධාන මූල්‍ය නිලධාරී කාමරය) මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ***2024/03/07*** දින **පෙ.ව. 10.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි** ලැබීමට සැලැස්විය යුතුය. ලංසු භාර ගැනීම ***2024/03/07*** දින **පෙ.ව. 10.00** ට අවසන් කරනු ලබන අතර, ඒ සමගම ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වූ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**09.** ලියුම් කවරයේ වම් පස ඉහල කෙළවරේ, කාර්යයේ නම සහ කොන්ත්‍රාත් අංකය සඳහන් කල යුතුය.

**10.** ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලබයි.

**ඉංජි. අජිත් ගුණසේකර,**
**වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්**
**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**
**අංක 230, බෞද්ධාලෝක මාවත,**
**වාරිමාර්ග දෙපාර්තමේන්තුව,**
**කොළඹ - 07**

**දිනය: 2024/02/14**